ආගමන සමය තෙවන ඉරුදින **දේව ප්‍රකාශන** 14-12-14

**පළමුවන දේව ප්‍රකාශන** යෙසායා 61:1-2,10-11

යෙසායා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"මම සමිඳාණන් කෙරෙහි බොහෝ ප්‍රීති වන්නෙමි"**

මහෝත්තම දෙවි සමිඳුන්ගේ ආත්මානුභාවය මා කෙරෙහි පිහිටා ඇත. දිළිඳුන්ට සුබ අස්න දෙසීමට ද බිඳුණු සිත් ඇත්තන්ට සුව සෙත දීමට ද වහලූන්ට මිදීම දානය කරන්න ද සිරකරුවන්ට නිදහස දන්වන්න ද එතුමාණෝ මා ආලේප කළ සේක.

සමිඳුන්ගේ කරුණාවේ දවස, සතුරන්ට දඬුවම් දීමේ දවස පළ කරන පිණිස ද වැලපෙන සියල්ලන් සනසන පිණිස ද එතුමා මා ආලේප කළ සේක.

මම සමිඳුන් කෙරෙහි බොහෝ ප්‍රීති වන්නෙමි. මාගේ දෙවිඳුන් කෙරෙහි මම ප්‍රීතියෙන් පිනා යන්නෙමි. මනාලයෙකු මල් මාලාවක් දමාගන්නාක් මෙන් ද මනාලිය ඇගේ ආභරණ පැළඳගන්නාක් මෙන් ද එතුමාණෝ ගැළවීම නමැති වස්ත්‍රය මට පළඳවන සේක. ධර්මිෂ්ඨකම නමැති සළුව මට හඳවන සේක.

පොළොව අලුත් පැළෑටි උපදවන්නාක් මෙන් ද උයන එහි වපුළ දේ ලියලවන්නාක් මෙන් ද, මහෝත්තම සමිඳුන් වන දෙවිඳාණෝ ධර්මිෂ්ඨකම හා ප්‍රශංසාව සියලූ ජාතීන් ඉදිරියෙහි හට ගන්වන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**පිළිතුරු ගීය**

ලූක් 1:46-50,53-55

**පිළිතුර : මාගේ දෙවිඳුන් කෙරෙහි මම ප්‍රීතියෙන් පිනා යන්නෙමි.**

**ගීය :** "මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි, මාගේ සිත මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි. මක්නිසා ද, එතුමාණෝ සිය දාසියගේ දීනතාව කුළුණු පාමින් සලකා වදාළ සේක. හැම පරපුරක් ම මෙතැන් සිට, භාග්‍යවන්තී ය' යි මට කියනු ඇත.

පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක. 'පරිශුද්ධයාණෝ' යනු එතුමන්ගේ නාමය ය. එතුමන්ගේ දයාව සිය බැතිමතුන් කෙරේ, පරපුරෙන් පරපුරට පැතිරේ.

සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා, ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. අප පියවරුන් වූ, ආබ්‍රහම්ට හා එම පරපුරට, සදහට ම පොරොන්දු වූ දයාව සිහි කරමින් සිය සේවක ඉශ්රායෙල් සෙනග හට, දයාව පෙන්වා පිහිට වූ සේක."

**දෙවන දේව ප්‍රකාශනය** 1 තෙසලෝනික 5:16-24

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් ගත් කොටසකි.

**ස්වාමින් වහන්සේගේ පුනරාගමනයේදී ඔබ නිදෝස්ව පවතික ලෙස ආරක්ෂා කරනු ලැබේවා.**

නිතර ම ප්‍රීති වන්න, නොකඩව යාච්ඤා කරන්න, සියල්ලෙහි දී ස්තුති දෙන්න. කිතුනුවන් වශයෙන් දෙවියන් වහන්සේ ඔබගෙන් බලාපොරොත්තු වන්නේ මෙය වේ. ශුද්ධාත්මානුභාවයට අවහිර නොකරන්න. දිවැස් වැකි සුළු කොට නොතකන්න. සියල්ල විමසා බලා, යහපත් දේ තදින් අල්ලාගන්න. සියලු ආකාර නපුරෙන් වළකින්න. සාමදානයේ දෙවියන් වහන්සේ ම ඔබ මුළුමනින් ම පවිත්‍ර කරන සේක්වා! ඔබගේ මුළු ආත්මය ද ප්‍රාණය ද ශරීරය ද අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනයේ දී නිදොස් ව තිබෙන ලෙස ආරක්ෂා කරනු ලැබේ වා ! ඔබ කැඳවන තැනැන් වහන්සේ විශ්වාසවන්ත ය. උන්වහන්සේ එය ඉෂ්ට කරනු නියත ය.

දේව වාක්‍යය එසේය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සුපුවත් ජය නද** යෙසායා 61:1

ආලේලූයා ! ආලේලූයා !
මහොත්තම දෙව් සමිඳාණන්ගේ ආත්මානුභවය
මා කෙරෙහි පිහිටා ඇත.
දිළිඳුන්ට සුභ අස්න දෙසීමට එතුමාණෝ මා ආලේප
කළ සේක.
ආලේලූයා !

**ශුද්ධවූ සුවිශේෂය** ජුවාම් 1:6-8, 19-28

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"මට අනතුරුව වඩින තැනැන්වහන්සේ ඔබ මැද සිටින සේක"**

දෙවියන් වහන්සේ එවා වදාළ මනුෂ්‍යයෙක් වී ය. ඔහුගේ නම ජොහන් ය. ඔහු පැමිණියේ, තමා මගින් සියලු දෙනා අදහාගනු පිණිස ආලෝකය ගැන සාක්ෂි දැරීමට, සාක්ෂිකරුවෙකු වශයෙනි. ඔහු ඒ ආලෝකය නොව, ඒ ආලෝකය ගැන සාක්ෂි දරන පිණිස ආ තැනැත්තේ ය. "ඔබ කවරෙක් දැ"යි අසන පිණිස ජුදෙව්වරුන් විසින් ජෙරුසලමෙන් පූජකයන් ද ලෙවීයයන් ද යැවූ කල, ජොහන් සාක්ෂි දෙමින්, "මම ක්‍රිස්තුස් නොවෙමි"යි නොසගවා ම ප්‍රකාශ කෙළේ ය. "එසේ නම් කිමෙක් ද? ඔබ එලියා දැ"යි ඔව්හු ඇසූ හ. "නැතැ'යි ඔහු කී ය. "ඔබ ඒ දිවැසිවරයා ද?" යන ප්‍රශ්නයටත්, "නැතැ'යි ඔහු කී ය. "එසේ නම්,

ඔබ කවරෙක් ද? අප එවූ අයට පිළිතුරක් දිය යුතු යි. ඔබ ගැන ම ඔබ කියන්නේ කිමෙක් දැ"යි ඔව්හු ඇසූහ.

"මම නම්, යෙසායා දිවැසිවරයා කී පරිදි, 'සමිඳාණන්ගේ මග පිළියෙළ කරන්නැ'යි පාළුකරයෙහි මොරගසන්නෙකුගේ හඬ වෙමි"යි ජොහන් පිළිතුරු දුනි. එවන ලද සමහරෙක් පරිසිවරුය. ඔව්හු ප්‍රශ්න කරමින්, "ඉදින් ඔබ ක්‍රිස්තුස් වත්, එලියා වත්, ඒ දිවැසිවරයා වත් නොවන්නෙහි නම්, බව්තීස්ම–ස්නාපනය කරන්නේ කුමක් නිසා දැ"යි ඇසූ හ. ජොහන් ද පිළිතුරු දෙමින්, "මම වතුරෙන්

බව්තීස්ම–ස්නාපනය කරමි. එහෙත්, ඔබ නාඳුනන කෙනෙක් ඔබ මැද වැඩ සිටිති. එනම්, මට පසුව වඩින තැනැන් වහන්සේ ය. උන්වහන්සේගේ පාවහන් පටි මුදන්නට වත් මම නොවටිමි”යි කී ය. මෙය සිදුවූයේ, ජොහන් බව්තීස්ම–ස්නාපනය කරමින් සිටි ජොර්දානෙන් එතෙර බෙතානියේ දී ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.